www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අවිශිබමයේ "ජයග්‍රහනයන්හි" දේශපාලන යතාර්ථය

**ප්‍රදීප් රාමනායක විසිනි**
**2016 ජනවාරි 16**

විශ්ව විද්‍යාල පද්ධතිය ඇතුලු සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය අලලා මතුවී ඇති ගැටලු වලට විසඳුම් ඉල්ලා, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලයේ (අවිශිබම) නායකත්වයෙන් පසුගිය දශක කීපය තුල සරසවි සිසුන් ගෙනගිය විවිධ විරෝධතා ව්‍යාපාර බොහෝවිට අවසන්වූයේ ඒවායේ කේන්ද්‍රීය ඉල්ලීම් වලට කවර හෝ විසඳුමක් නොමැතිවය. සමහර අවස්ථාවන්හි දී, එම ඉල්ලීම් වලට "විසඳුම්" ලෙස ලැබුනු යම් සීමිත සහනයන් මහා ජයග්‍රහන ලෙස හුවා දක්වමින්, තම නායකත්වය යටතේ සිසු අරගල ජය ගනිමින් සිටින බවට අවිශිබම උදම් අනයි.

ඔවුන් විසින් උදම් අනන "ජයග්‍රාහී" අරගල කීපයක වාර්තාව සැකෙවින් මෙසේය:

* "ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ දීර්ඝතම සත්‍යග්‍රහය" ලෙස අවිශිබම විසින් වග වර්නනා කල, 2015 වසරේදී දින 238 ක් තිස්සේ ඇදීගිය රජරට විශ්වවිද්‍යාලයේ සත්‍යග්‍රහය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2014 වසරේ පැවති දින 59ක සත්‍යග්‍රය, 2014 සහ 2015 වසරවල සබරගමුව සරසවියේ පිලිවෙලින් දින 59 සහ 65 බැගින් පැවති සත්‍යග්‍රහය යන මේ සියල්ල, එම විරෝධතා මර්දනය කිරීමේ අටියෙන් පාලන අධිකාරයන් විසින් පන්ති තහනමට ලක් කෙරුනු, සිසුන්ගේ පන්ති තහනම් ඉවත්කල පමනින් නවතා දැමින.

නමුදු, ඉහත සඳහන් කෙරුනු සියලු සත්‍යග්‍රහයන් අවිශිබම විසින් පවත්වාගෙන ගියේ නේවාසිකාගාර ගැටලු විසඳීම, විශ්වවිද්‍යාල තුල පාඨමාලා මුදලට විකිනීම නැවැත්වීම, අධ්‍යාපන පෞද්ගලිකරනය නැවැත්වීම ඇතුලු ඉල්ලීම් ගනනාවක් මුල්කර ගනිමිනි.

* ඉහල දැමූ පාඨමාලා ගාස්තු පහත හෙලීම, අහිමි කෙරී ඇති සිසු නිදහස ස්ථාපිත කිරීම, ශිෂ්‍ය සංගම් යලි පිහිටුවීම, සිසුන්ගේ පන්ති තහනම් ඉවත් කිරීම ඇතුලු කරුනු කිහිපයක් මුල්කරගනිමින්, 2011 වසරේ විවෘත විශ්ව විද්‍යාල සිසුන් ගෙනගිය සත්‍යග්‍රහය, දින 227 කට පසු, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති මොහාන් ද සිල්වා සමග පැවැත්වූ සාකච්ඡාවකින් පසු නවතා දමන ලදී.

අවිශිබම නායකයින් එම සත්‍යග්‍රහය අවසන් කරන මොහොතේ පවසා සිටියේ පාඨමාලා ගාස්තු අඩු කරන බවට කොමිසම වෙතින් ලිඛිත පොරොන්දුවක් ලබාගත් බවයි. එහෙත් විවෘත විශ්වවිද්‍යාලයේ සිසුන් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට (ලෝසවෙඅ)* පැවසුවේ: "පාඨමාලා ගාස්තු අඩුකිරීමක් පිලිබඳ ලිඛිත පොරොන්දුවක් හෝ ලැබුනේ ඉංජිනේරු පාඨමාලාව සඳහා පමනයි. අනෙකුත් සියලු පාඨමාලා වල වැඩිකල ගාස්තු එලෙසම පවතිනවා. විශ්ව විද්‍යාලය තුල ශිෂ්‍ය මර්දනය දිගටම පවතිනවා. සිසුන්ට පනවා ඇති පන්ති තහනම් ඉවත් කරල නැහැ. මහා ශිෂ්‍ය සංගමය විසුරුවා නිලවරන පැවැත්වීම නතර කරල." යනුවෙනි.

* සිවු අවුරුදු සම-සෞඛ්‍ය උපාධිය තුන් අවුරුදු පාඨමාලාවක් ලෙස පිරිහෙලීමට විරෝධතාව පල කරමින් 2014 වසරේ ආරම්භ කල සත්‍යග්‍රහයන් දවස් 150 පසු කර යද්දී, එම උපාධිය නැවත සිව් අවුරුදු පාඨමාලාවක් බවට පත් කරන බවට ආන්ඩුව ලබාදුන් සහතිකය මත නවතා දැමින.

සම-සෞඛ්‍ය පාඨමාලාවක් ලෙස වර්ගීකරනය වී ඇති ඖෂධවේදී පාඨමාලාව හදාරන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිසුවියක්: "කප්පාදුවට පෙර පැවති පාඨමාලා අන්තර්ගතය අනුව උපරිම සම්මාන (ක්‍රෙඩිට්) 140ක් දක්වා වන පරිදි විෂය ඒකක ප්‍රමානය තෝරාගැනීමක් කල හැකිව තිබුනත්, සංශෝධිත සිව් අවුරුදු උපාධියේ උපරිම සම්මාන ප්‍රමානය 120කට සීමා කරල. මේ හේතුවෙන් තමන්ට ආවරනය කරගැනීමට හැකිවන ඒකක ප්‍රමානය අඩුවනවා. එයින් උපාධියේ ප්‍රමිතිය පහල වැටෙනව" ඇය ලෝසවෙඅ වෙත පවසා සිටියාය.

* සිය ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉහලම ජයග්‍රහනයක්යැයි අවිශිබම ඔජවඩන එච්එන්ඩීඒ පාඨමාලාවට උපාධි සමානතාවය යලි ලබාගැනීමේ සැබෑ තතු පිලිබඳව කතා කරමින් එච්එන්ඩීඒ ශිෂ්‍ය සංගමයේ හිටපු කැඳවුම්කරුවෙකු *ලෝසවෙඅට* පැවසුවේ: තම ඩිප්ලෝමාවට රැකියා වෙලඳපොලේදී වානිජවේදී උපාධි සමානතාවය නොලැබෙන බවයි. "ආන්ඩුව 2014 වසරේදී පලාත් පාලන ආයතන වලට යවපු ලියුමකින් දැනුම්දීලා තියෙනවා ගනකාධිකරන ඩිප්ලෝමාධාරීන් පහල වැටුප් ශ්‍රේනියකින් බඳවාගන්න කියලා."

සිසු අරගල දියකර හැරීමේ උපාමාරු ලෙස අනුප්‍රාප්තික ආන්ඩු සහ පරිපාලනයන් ලබා දෙන මෙම සීමිත සහනයන් "මහා ජයග්‍රහන" ලෙස අවිශිබම විසින් හුවා දක්වන්නේ,

බලයට පත්වෙන සෑම ආන්ඩුවක්ම, මහජන අධ්‍යාපනය දැවැන්ත ලෙස කප්පාදු කරමින් අධ්‍යාපනය ලාභ ලබන කර්මාන්තයක් බවට පත් කිරීමේ තම පන්ති පිලිවෙත අඛන්ඩව සහ වේගවත්ව ක්‍රියාවට නගමින් සිටිද්දීය.

අධ්‍යාපනය සඳහා රාජ්‍ය වියදම සියයට 1.5 ක මට්ටමට කප්පාදු කෙරී ඇති අතර, සුවිසල් ගාස්තු අය කෙරෙන ජාත්‍යන්තර පාසැල්, වෙනත් පුද්ගලික පාසැල් සහ උපාධි සහ ඩිප්ලෝමාවන් ප්‍රදානය කෙරෙන උසස් අධ්‍යාපන ආයතනයන් හතු පිපෙන්නාක් මෙන් ව්‍යාප්ත වෙමින් පවතී. රජයේ විශ්ව විද්‍යාලයන් ද ගාස්තු අය කෙරෙන උපාධි පාඨමාලාවන්ගෙන් සමන්විත ආයතන බවට පත් කෙරී ඇත.

පෞද්ගලික අංශයේ අධ්‍යාපන ආයතන ව්‍යාප්ත කිරීමට කටයුතු කරන බවට විශ්ව විද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල පසුගිය දා ප්‍රකාශ කලේය. එහි මෑතම පියවර ලෙස, මාලඹේ සයිටම් ආයතනයේ වෛද්‍ය සිසුන්ට රජයේ රෝහල් තුල සායනික පුහුනුව ලබාදීමට ආන්ඩුව තීරනය කලේ එයට එරෙහිව පැන නැගුනු මහජන විරෝධය නොතකමිනි.

මෙවර අයවැය තුලින් ද අධ්‍යාපනය වෙනුවෙන් කෙරෙන රාජ්‍ය වියදම කප්පාදු කිරීම තීව්‍ර කෙරී ඇත. සරසවි පාඨමාලා මිල දී ගැනීමට හැකිවන පරිදි වවුචර් ක්‍රමයක් හඳුන්වා දීම සහ සංගත, සුලු හා මධ්‍යම පරිමාන කර්මාන්තවලට සේවකයන් සම්පාදනය කෙරෙන ආයතන බවට සරසවි පත් කිරීම ඇතුලු ප්‍රතිසංස්කරන හඳුන්වාදීමට අය-වැය මගින් පියවර ගෙන තිබේ. තවද ආන්ඩුව විසින් යෝජනා කරන ශිෂ්‍ය නය ක්‍රමය, අධ්‍යාපන වියදම අඩු කරගැනීම සඳහා ලොවපුරා ධනේශ්වර ආන්ඩු බහුලව භාවිතා කර ඇති ක්‍රමයක් වන අතර එම නය ගෙවාගත නොහැකිව බෙහෝ තරුන තරුනියෝ නයගැති භාවයට පත්ව සිටිති.

ශ්‍රී ලංකාව ද ඇතුලු ලොවපුරා පාලක පන්තීන්ගේ මෙම ප්‍රහාරක පිලිවෙත් ගලා එන්නේ ධනේශ්වර පද්ධතිය මුහුන දී සිටින ඓතිහාසික අර්බුදයෙනි. තම ලාභ රේට්ටු කඩා වැටීමට ප්‍රතිචාරී ලෙස, 1980 ගනන් මුල සිට අධ්‍යාපනය ඇතුලු සමාජ සුබසාධනයන් කප්පාදු කිරීමට පියවරගත් පාලක පන්තීහු, 2008 න් ඇරැඹී බිඳ වැටීමක් තුලින් ගමන් කරන ලෝක ධනේශ්වර අර්බුදය හමුවේ, වඩවඩාත් ආක්‍රමනකාරී ලෙස මෙම පිලිවෙත් ක්‍රියාවට නගමින් සිටිති. පසුගිය ශත වර්ෂයේ කම්කරු පන්තිය දිාගත් සියලු සමාජ හා ප්‍රජාතන්ත්‍රිය අයිතීන් ආපසු උදුරා ගැනෙන සමාජ ප්‍රතිවිප්ලවයක් දක්වා එම ප්‍රහාරය වර්ධනය කිරීමට ධනේශ්වර පාලක පන්තීන් වෛෂයිකව තල්ලු කෙරී ඇත. ග්‍රීසිය සහ ස්පාඤ්ඤය වැනි යුරෝපා රටවල ද, ලොව ධනවත්ම රට වන එක්සත් ජනපදයේ ද, ශ්‍රී ලංකාවේ ද මහජනතාව මුහුන දී සිටින්නේ මෙම ප්‍රහාරයටයි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙම ප්‍රහාරයන්ට එරෙහිව විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ අඛන්ඩව අරගලයට අවතීර්න වෙමින් සිටිති. ප්‍රමුඛතම කාර්යය නම්, ප්‍රහාරයේ මූලය පවතින්නේ ලෝක ධනේශ්වර ක්‍රමයේ පද්ධතිගත අර්බුදය තුල බව විද්‍යාත්මකව අවබෝධ කර ගැනීමයි. ඉන් ගලා එන නිගමනය වන්නේ, ලෝක ධනේශ්වර පද්ධතිය පෙරලා දැමීම එල්ල කර ගත් අරගලයකින් තොරව, එනම් ජාත්‍යන්තර සමාජවාදය සඳහා කරන සටනකින් තොරව, මෙම ප්‍රහාරයන් පරාජය කල නොහැකි බවයි.

ධනේශ්වරයේ කේන්ද්‍රීය ප්‍රහාරයන් අංශු මාත්‍රයකින් හෝ ආපසු හැරවීමට අසමත්ව ඇති අවිශිබමයේ "අරගලයන්" එවන් සටනකට මුලුමනින්ම ප්‍රතිකූලව පිහිටයි. එම "අරගල" වනාහි, පාලකයන්ගේ සීමිත සහන "මහා ජයග්‍රහනයන්" ලෙස හුවා දක්වමින් ධනේශ්වර ක්‍රමය තුල තම අයිතීන් තහවුරු කරගත හැකිය යන මිථ්‍යාව ශිෂ්‍යයන් අතර වැපිරීමට යොදා ගැනෙන මාධ්‍යයන්ය. "අරගල කලොත් ජයග්‍රහන තිබෙනවා" යන අවිශිබම සූත්‍රයේ ඇත්තේ ධනේශ්වර ක්‍රමය රැක දෙන මෙම ප්‍රතිගාමී අන්තර්ගතයයි.

ධනපති ක්‍රමයට අභියෝග නොකෙරෙන අවිශිබමය යටතේම සිසුන් රඳවා තැබීම තම පැවැත්ම සඳහා වඩා යෝග්‍ය බව පාලක පන්තිය දනී. ඒ අනුව ගත් කල මෙම සීමිත සහන වනාහි, ඉහත ප්‍රතිගාමී සූත්‍රය තොරොම්බල් කිරීම සඳහා පාලකයන් විසින් අවිශිබමට ලබා දෙන ශක්ති ජනකයන්ය.

මෙලෙස ධනේශ්වරයේ උපකරනයක් ලෙස ක්‍රියාත්මක වන අවිශිබම සහ එයට නායකත්වය දෙන ව්‍යාජ වාම සංවිධානය වන වන පෙරටුගාමී සමාජවාදී පක්ෂය (පෙසප), අනෙකුත් ව්‍යාජ වාම පක්ෂවල හා වෘත්තීය සමිතිවල නායකයින් සිය වේදිකාවට නංවා ගෙන, ඉහත "ජයග්‍රහන" ඔවුන් ලවා ඔජ වඩවා පවසන්නේ, "ශිෂ්‍ය ව්‍යාපාරය ආදර්ශයට ගෙන" ධනේශ්වර ආන්ඩුවට වඩාත් බලපෑම් දැමිය හැකි පුලුල් පෙරමුනකට එක්වන ලෙසයි. පෙසප වැනි ව්‍යාජ වම්මුන් ග්‍රීසිය තුල එක්ව, "කප්පාදු පිලිවෙත් ආපසු හැරවීමට" යැයි කියමින් ගොඩ නැගු සිරිසා ව්‍යාපාරය එවන් පෙරමුනකි. ග්‍රීසිය තුල බලයට පත්ව සිටින සිරිසා, "කප්පාදු පිලිවෙත් ආපසු හැරවීම" කෙසේ වෙතත්, එම පිලිවෙත් ක්‍රියාවට නගන ප්‍රහාරකයා බවට පත්ව ඇත.

© www.wsws.org